රසඳුන, ක්‍රීඩා සහ රැකියා අතිරේක ඇතුළත් සිළුමිණ මෙවර පිටු 104යි

සිළුමිණ

சிழுமின The Silumina

■ ආරම්භය - 1930 මාර්තු 30 ■ ප්‍රවෘත්ති පත්‍රයක් වශයෙන් ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කරන ලදී ■ 91 වැනි කාණ්ඩය 51 වැනි පත්‍රය ★

■ ශ්‍රී බුද්ධ වර්ෂ 2564ක් වූ දුරුතු ... 05 ... උඳුවප් පුර ... ඉරිදා ■ වර්ෂ 2020ක් වූ දෙසැම්බර් මස 20 වැනි ඉරිදා මිල රු 60.00

රාජ්‍ය හා පෞද්ගලික අංශයේ රැකියා ඇබෑර්තු ඇතුළත්

සිළුමිණ JOBS

↘5 රට වටා ඔඩුදුවන කොරෝනාව

↘10 විශ්‍රාම වැටුපට කොකා පෙන්වූ ICTA

↘10 ගම්පොළ රෝහලේ 'කොරෝනා පාටිය'

ගම සමඟ පිළිසඳර

වැඩ සමඟ යළි ගමට

↘11 ග්‍රාම සංවර්ධනයේ වසන්තය ඇරඹෙයි

↘15 ලෝක වාර්තාවක් තැබූ සිවු නිවුන් දරු උපත

↘15 භීෂණ සමයේ ඝාතකයා 31 වසරකට පසු දංගෙඩියට

විදෙස් ආයෝජනයෙන් රැකියා ලක්ෂයක්

වසර ආරම්භයේදීම රැකියා 10,000ක්

(තාරක වික්‍රමසේකර)

නව රැකියා 10,000ක් උත්පාදනය කෙරෙන මහා පරිමාණ විදේශ ආයෝජන 3ක් නව වසර ආරම්භයේදීම මෙරට ස්ථාපිත කෙරෙන බව මුදල් හා ප්‍රාග්ධන වෙළෙඳපොළ සහ රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ රාජ්‍ය අමාත්‍ය අජිත් නිවාඩ් කබ්රාල් සිළුමිණට පැවසීය.

රුපියල් බිලියන 550ක් හෙවත් කෝටි 55,000ක විදේශ ආයෝජන මෙරටට ලැබෙන බවද ඔහු පෙන්වා දුන්නේය. රජයේ ආරංචි මාර්ගවලට අනුව 2021 වසර තුළදී රැකියා ලක්ෂයකට අධික ප්‍රමාණයක් අනෙක් විදෙස් ආයෝජන අනුව ලැබෙනු ඇත.

පළමු ආයෝජන 3 යටතේ පෝර්ට් සිටි හෙවත් වරාය නගරයේ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවට අදාළ ගිවිසුම ඉකුත් 17දා අත්සන් කළ බවද ඔහු පෙන්වා දුන්නේය. රුපියල් බිලියන 185ක ආයෝජනයක් වන එය චීනයේ 'චයිනා හාබර් ඉන්ටනැෂනල් හා එල්බීඑල්සී සමූහයේ - බුවුන්ස් අතර අත්සන් කෙරුණේ කොළඹ ජාත්‍යන්තර මූල්‍ය මධ්‍යස්ථානය වෙනුවෙනි.

ඊට අමතරව හම්බන්තොට කර්මාන්තපුරයේ රබර් නිෂ්පාදන කර්මාන්තශාලාවක් හා 8 වැනි පිටුවට

පළාත් සභා ඡන්දය පැරැණි ක්‍රමයට

(ශාන්ති ධර්මප්‍රිය මෙන්ඩිස්)

පළාත් සභා මැතිවරණය ලබන අප්‍රේල් මසට පෙර පැවැත්වීමට රජය අදහස් කර ඇති අතර එය පැරැණි ක්‍රමයටම පැවැත්වෙනු ඇතැයි රජයේ ආරංචි මාර්ග වීමේ ලකාවර්ණය කෙළේය. මැතිවරණය පැරැණි ක්‍රමයට පැවැත්වීම සම්බන්ධව කැබිනට් පත්‍රිකාවක් මේ වනවිටත් ඉදිරිපත් කර ඇති බව පළාත් සභා සහ පළාත් පාලන ඇමැති ජනක බණ්ඩාර තෙන්නකෝන් පවසයි. 8 වැනි පිටුවට

'සේනා' මඬින්න අලුත් වයිරසයක්

(නිහාල් පී. අබේසිංහ)

සේනා දළඹු උවදුර මැඩීමට සෛව පාලන අලුත් වයිරසයක් හඳුන්වාදීමටත් සියලුම පළාත් සභාවලට රුපියල් ලක්ෂ 60 ක් බැගින් රුපියල් ලක්ෂ 540 මුදලක් ලබාදීමටත් පියවර ගෙන ඇතැයි කෘෂිකර්ම ඇමැති මහින්දානන්ද අලුත්ගමගේ පවසයි. එමෙන්ම සේනා නිසා සිදුවන වගා හානි සඳහා සියලුම වන්දි 8 වැනි පිටුවට

ගංගා 103ක් සුරැකීමට කෝටි 20ක්

(නිහාල් පී. අබේසිංහ)

මෙරට ගංගා 103ම සංරක්ෂණය සඳහා 'සුරකිමු ගංගා' නමින් ශ්‍රී ලංකාවේ ප්‍රථම වරට පාරිසරික සංරක්ෂණ වැඩසටහනක් ආරම්භ කර ඇති බවත්, ඒ සඳහා රජය විසින් වසරකට රුපියල් කෝටි 20ක් අනුමත කර ඇති බවත් එම කටයුතු පෙබරවාරි මාසයේදී ආරම්භ කෙරෙන බව ද පරිසර ඇමැති මහින්ද අමරවීර සිළුමිණට පැවසීය.

පරිසර අමාත්‍යාංශය හා මධ්‍යම පරිසර අධිකාරිය විසින් සුරකිමු ගංගා වැඩසිළිවෙළ ක්‍රියාත්මක කරන අතර ඊ යටතේ කැලණි ගඟ ජලාධාර ප්‍රදේශයේ පදිංචිකරුවන් මෙන් ම ඇතැම් සුළු හා මහා පරිමාණ කර්මාන්තකරුවන් විසින් කැලණි ගඟ ජල දූෂණයට 8 වැනි පිටුවට

'ගම සමඟ පිළිසඳර' පියවර දසදහසක් පෙරටම!

ජනතාවගේ ප්‍රශ්න විසඳීමේ අරමුණින් ජනාධිපති ගම සමඟ පිළිසඳර වැඩසටහන දැන් අඛණ්ඩව බලන්ගොඩ ඉඹුල්පේ රාවණාකන්ද ග්‍රාමයේ ... පිළිසඳර වැඩසටහනේදී ජනාධිපති රාජපක්ෂයෙ... ඉදිරිපත් කළ අධ්‍යාපනික ගැටලු ගැන සවන් දුන්...

නත්තල් දේව මෙහෙයන් සෞඛ්‍ය නිර්දේශ අනුව බව අගරදගුරු හිමියෝ පවසති

(සුරේකා නිල්මිණි ඉලංගකෝන්)

කොවිඩ් 19 වසංගතයේ ශීඝ්‍ර ව්‍යාප්තිය සැලකිල්ලට ගනිමින් 24 වැනිදා මධ්‍යම රාත්‍රියේ පවත්වන නත්තල් දේව මෙහෙයන් 24 වැනිදා සවස 6 සිට පැයෙන් පැයට 50 දෙනකුට නොවැඩි පිරිසකගේ සහභාගීත්වයෙන් නිරෝධායන නිතිරීතිවලට අනුකූලව පවත්වන ලෙස කොළඹ අගරදගුරු පදවියේ කතෝලික බිසම් 'පාලක පියතුමන්ලාට උපදෙස් ලබා දී තිබෙන බව කොළඹ අගරදගුරු අති උතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණෝ සිළුමිණට පැවසූහ. හුදකලා කර නොමැති ප්‍රදේශවල පිහිටි තිතුනු දේවස්ථානවල පමණක් එසේ නත්තල් දේව මෙහෙයන් පැවැත්වෙන අතර 24 වැනිදා මධ්‍යම රාත්‍රී නත්තල් දේව මෙහෙය සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවන්ගෙන් රූපවාහිනී නාලිකා කිහිපයක් ඔස්සේ සජීවීව විකාශනය කෙරෙන බවද උන්වහන්සේ පැවසූහ. 8 වැනි පිටුවට

...ල්

...රු

... යටතේ ... 20 වසරේ ... අධ්‍යාපන ... ගුරුවරු ... ක්‍රමවේදය ... මෙයින් ... ද තවත් ගුරුවරු 1,447ක ... ක්‍රමවේදය යටතේද මාරු කිරීම් සිදුකර ඇත. මේ වන විට එම ගුරුවරුන් විසින් ගුරු මාරුවීම සම්බන්ධව ඉදිරිපත් කළ අභියාචනා විමසීමේ කටයුතුද ආරම්භ වී ඇත.

ශ්‍රී ලංකාවේ මේ වන විට සමස්ත ගුරු සංඛ්‍යාව 2,32,964 ක් වන අතර එයින් ජාතික පාසල්වල පමණක් ගුරුවරු 39,179 ක් සේවය කරති. යම් ගුරුවරයෙක් එකම පාසලක සේවය කළද 8 වැනි පිටුවට

රතන හිමි යළි පාර්ලිමේන්තු...

අපේ ජන බල පක්ෂයේ ජාතික ලැයිස්තු මන්ත්‍රී ධුරය සඳහා අතුරලියේ රතන හිමියන් පත් කළ බව මැතිවරණ කොමිසමේ සභාපතිවරයා පවසා සිටී.

අතුරලියේ රතන හිමියන් ... ත්තුවේ වසර ගණනාවක් ජාතික ලැයිස්තු මන්ත්‍රී ධුරය දැරූ හිමිනමක්ද වේ.

... මිලියන 33කට විදලා

8 වැනි පිටුවට

අපේක්ෂකමට අත දෙන්න 'Made in Sri Lanka' එයි

බස්නාහිරින් පිටව යන අයට කොරෝනා ඇන්ටිජන් පරීක්ෂණ

(හසිනි ධර්මප්‍රිය මෙන්ඩිස්)

බස්නාහිර පළාතෙන් පිටත්ව යන පුද්ගලයන් සඳහා කොරෝනා ඇන්ටිජන් පරීක්ෂණ කිරීමට සෞඛ්‍ය අමාත්‍යාංශය පියවර ගන්නා බව යුද හමුදාපති ලුතිනන් ජනරාල් ශවේන්ද්‍ර සිල්වා සිළුමිණ ට පැවසීය. ඒ අනුව බස්නාහිර පළාතේ ස්ථාන තුනක ඇන්ටිජන් ජංගම පරීක්ෂණ සිදු කරන

සිම්පල් මෑන්

ප්‍රීචි බොන්න යන්න

ශ්‍රී ලංකාවේ ප්‍රථම වරට

SLT GO app එක අදම Download කරගන්න! SLT GO Global Community එකට Connect වෙන්න.

ලොවපුරා Hotspots මිලියන 23ක් සමඟින් දිවයින පුරා Hotspots මිලියනයක් දක්වා

sltgo